# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අපරාධ නඩු විධාන සංග්‍රහය
## (සංශෝධන)

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම
සඳහා වූ පනත් කෙටුම්පතකි.

---

අධිකරණ අමාත්‍යතුමා විසින් 2015 දෙසැම්බර් මස 11 වන දින
ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 09 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[46 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 3.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

2—PL 009560—475 (2015/12)

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 135 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයට දණ්ඩ නීති සංග්‍රහයේ 291ඈ වගන්තිය ඇතුළත් කිරීම මගින් සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වන්නේ, 291ඈ වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් සංජානනය කිරීම සඳහා නීතිපතිවරයාගේ පූර්ව අනුමතය අවශ්‍ය බවට පත් කිරීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික සංශෝධනයක් සිදු කරනු ලැබේ.

## අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

එල්.ඩී.—ඕ. 40/2015.

### 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධන කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2015 අංක    දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 15 දරන පනතේ 135 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 135 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් "දණ්ඩ නීති සංග්‍රහයේ 290අ වගන්තිය යටතේ හෝ 291ආ වගන්තිය යටතේ හෝ දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "දණ්ඩ නීති සංග්‍රහයේ 290අ, 291ආ හෝ 291ඇ වන වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය එහි 291ආ වගන්තියට අදාළ සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන් ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| "291ඇ | භාෂිත, ලිඛිත හෝ කියවීමට අදහස් කරනු ලැබූ වචනයෙන් හෝ සංඥාවලින් හෝ දැකිය හැකි නිරූපණවලින් හෝ අන්‍යාකාරයෙන් දරුණු ක්‍රියා හෝ ආගමික, වාර්ගික හෝ ජාතික අසමගිය හෝ අසන්තෝෂය හෝ සතුරුබව ඇති කරන හැඟීම් ඇති කිරීම හෝ ඊට පෙළඹවීම | වරෙන්තු නොමැතිව සිරභාරයට නොගත යුතු ය | සිතාසි | ඇප දිය හැකිය | සමථයට පත් කළ නොහැකිය | අවුරුදු දෙකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීම | මහෙස්ත්‍රාත් අධිකරණය.". |

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.